# පිටියේ දෙවියන්ගේ කෝල් මුර කවි: පුස්කොළපොත් ඇසුරෙනි.

වයි.කේ.තිස්ස බණ්ඩාර.

පිටියේ දෙවියන් යනු දුම්බර, හාරිස්පත්තුව, හේවාහැට යන ප්‍රදේශවල සහ මහනුවර ඇතැම් තැන්වල පුද පූජාවට ලක්වන ප්‍රාදේශීය දේවතා සංකල්පයකි. මේ දෙවියන් සම්බන්ධව බොහෝ තොරතුරු ලියා පළකැර තිබේ. එම පුවත් අනුව මෙම දේවතා සංකල්පයේ සම්භවය හා ව්‍යාප්තිය ආශ්‍රිත බොහෝ කරුණු දැනගත හැකිය. තවද ලියා නැති කරුණු රැසක් ජනශ්‍රැති ආශ්‍රයෙන් පවත්වාගෙන එනු ලැබේ. විවිධ තරාතිරමේ පර්යේෂකයන් විසින් ලියනු ලැබ ඇති තොරතුරු අනුව පිටියේ දෙවියන්ගේ පුරාණ කථා ආශ්‍රිත සාහිත්‍යයක් නිර්මාණය වී තිබේ.[1] සමාජ විද්‍යාව, ඉතිහාසය, ජනශ්‍රැතිය, මානව වංශ විද්‍යාව හා ආගම් විෂයයට අදළව ඒවා වර්ග කළ හැකිය. මෙම දෙවියන් පිළිබඳව අවසන් ලෙස තොරතුරු රැස්කිරීමක් හෝ පර්යේෂණ පැවැත්මක් හෝ ලියා පළකිරීමක් දැනට සිදුව නැත. පර්යේෂණය කළ යුතු කොටස් බොහෝ විය හැකිය. පහත මූලාශ්‍ර පදනම් කැරගෙන මේ ගැන ලියැවී ඇති යම් ප්‍රමාණයක තොරතුරු දැනගත හැකිය.

පිටියේ දෙවියන් සම්බන්ධයෙන් කෝල්මුර කවි ලියැවී තිබේ. නරේන්ද්‍රසිංහ රජුගේ ආරාධනයෙන් සිය රාජ සභාවේ කවියා වූ දොඩංවල කිවිඳුන් විසින් මේ උක්ත කාව්‍යාවලිය ප්‍රබන්ධ කරන ලදැයි මේ කවි පන්තියේ අවසන් කවි තුනෙන් හෙළි වේ. ඒ අනුව ශක වර්ෂ 1649 නිකිණි මස ගුරු දිනක මේ කවි ලියූ බව සඳහන් වෙයි. කවි ප්‍රමාණය 159ක් බව ද එයින් කියැවේ. මෙසේ ලියන ලද පුස්කොළ පොත් පිටපත් ඉතා සීමිතය. මෙයින් පිටපත් කීපයක් එංගලන්ත බ්‍රිතාන්‍ය කෞතුකාගාර පුස්තකාලයේ හියු නෙවිල් එකතුවේ තිබෙන බව වාර්තා වෙයි. හියු නෙවිල් යනු ලංකාවේ සේවය කළ බ්‍රිතාන්‍ය ජාතික නිළධාරියෙකි. ඔහු ක්‍රි.ව. 1871 දී හාරිස්පත්තුව වැඩ බලන පොලිස් මහේස්ත්‍රාත් වශයෙනුත් 1872 දී ගම්පළ වැඩ බලන පොලිස් මහේස්ත්‍රාත් වශයෙන් සේවය කැර තිබේ. ඊට අමතරව ක්‍රි.ව. 1894 තෙක් දිවයිනේ බොහෝ පළාත් වල පරිපාලන සේවයේ ද යෙදී සිටි අයෙකි. මේ කාලය තුළ ලංකාවෙන් එකතු කැරගත් පුස්කොළ පොත් දහස් ගණනක් ඔහු එතෙර ගෙන ගියේය. එම පොත් අතර අප රටේ දේශීය කලා ශිල්ප, සාහිත්‍ය, පුරාවිද්‍යාව, පුරාක්ෂර විද්‍යාව, ජනශ්‍රැතිය, මානව විද්‍යාව, ආගම, ඉතිහාසය, භාෂාව, සාහිත්‍ය හා සංස්කෘතියට අයත් පොත් පවතින බව වාර්තා වෙයි. එම පොත් සම්බන්ධයෙන් ඔහු සටහන් තබා තිබේ. ලංකාවේ ඇතැම් පර්යේෂකයන් විසින් එකී කෘති සමහරක් ගැන බ්‍රිතාන්‍ය කෞතුකාගාර පුස්තකාලයෙන් අධ්‍යයනය කැර පළකරනු ලැබ තිබේ.

1. වජිරඥාණ හිමි, ගුන්නෑපාන .- (1960) විහාර වග විත්ති ; ගුණසේන, කොළඹ : පිටු 1-4. වාචිස්සර හිමි, කොටගම .- (1960) සරණංකර සඞඝරාජ සමය ; දොන් ඇඩ්වින් සහ සමාගම, කොළඹ: පිටු 93-94. තෙන්නකෝන්, විමලානන්ද .- (1963) උඩරට මහ කැරැල්ල ; ගුණසේන, කොළඹ: පිටු 344-345. ධීරානන්ද හිමි, කහටපිටියේ .- (1965) ගම්පොළ යුගය ; ගුණසේන, කොළඹ: පිටු 203-204. ඩේවි දුටු ලංකාව (1967), අනුවාදක ඇල්ලේපොල එච්. එම්. සෝමරත්න. සංස්කාරක ආචාර්ය විමලානන්ද තෙන්නකෝන් .- : ගුණසේන, කොළඹ: පිටුව 101. ධම්මානන්ද හිමි, නාවුල්ලේ .- (1969) මධ්‍යම ලංකා පුරාවෘත්ත ; ගුණසේන, කොළඹ: පිටු 37-38. මහවැලි වංශය, 2. කාණ්ඩය (1985), සංස්කාරක ඩබ්.එම් ඒ. ඒකනායක මහවැලි සංවර්ධන අමාත්‍යාංශය කොළඹ: පිටු 536 (සහ තවත්). සෙනෙවිරත්න, නි. බ. මා. .- (1989) සිංහල කාව්‍ය සංග්‍රහය මාතර යුගය ; රජයේ මුද්‍රණාලය , කොළඹ : (නැවත මුද්‍රණය) පිටු 221-231. කාරියවසම්, තිස්ස .- (1991) සිරිලක් දෙවිවරු ; තරංජි ප්‍රින්ටර්ස්, දෙහිවල: පිටු 168-176. ධර්මදාස, කේ. එන්. ඕ. සහ තුන්දෙණියේ එච්.එම්.එස් .- (1994) සිංහල දේව පුරාණය ; රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව , කොළඹ : පිටු 303-307. ජෝන් ක්ලිෆර්ඩ් හෝල්ට්, මකුට මුනිධාරී අවලෝකිතේශ්වර නාථ ලංකා පුරාණය පරි.පී. බී. මීගස්කුඹුර .- (1994); ප්‍රදීප ප්‍රකාශකයෝ , කොළඹ : පිටු 197-198. විජයවර්ධන, විභාවි ශ්‍රී .- (1996) සිංහල රණවිරු දෙවිවරු ; එස් ගොඩගේ, කොළඹ : පි.100-101. වීරසේකර, තිස්ස .- (1997); සිංහල ජනශ්‍රැතිවලින් නිරූපිත අපේ සංස්කෘතිය; ගුණසේන, කොළඹ: පි.95-96. වික්‍රමසිංහ, ඩී. පී. .- (1998) මග දිගට ජන කතා ; සූරිය ප්‍රකාශකයෝ , කොළඹ : පිටු. 111. <u>මහනුවර තොරතුරු</u> (1999), සංස්කරණය ගොඩගම මංගල හිමි .- ශ්‍රී සුමංගල විද්‍යාලය, මහනුවර: <u>මහනුවර ආශ්‍රිත පිටියේ දෙවි ඇදහීම හා හපුගොඩ පිටියේ දේවාලයේ කාල නිර්ණය. වයි.කේ. තිස්ස බණ්ඩාර.</u> පිටු 140-171. <u>දේවවිත්ති සහිත කෝල්මුර කවි;</u> සම්.පෙරේරා ජී.එස් .- (2003) . මොඩර්න් ප්‍රකාශකයෝ, කොළඹ: පි.77-78. සේනානායක, පියතිස්ස .- (2007) සෙංකඩගල පුරාණය ; රත්නදීප ග්‍රන්ථමාලා 4, ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ බුද්ධ ජයන්ති ලේකම් කාර්යාලයේ ප්‍රකාශනයකි කොළඹ : පිටු 216-218. <u>සාරථී</u> වෙළුම 06 (2008), සංස්කරණය වයි.කේ. තිස්ස බණ්ඩාර සහ තවත් අය... .- සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මධ්‍යම පළාත මහනුවර: <u>දුම්බර අඩවියට අධිපති පිටියේ බණ්ඩාර දෙවියෝ එස්.කේ. ජයවර්ධන.</u> පිටු 42-79. සාධනප්පසාද ශාස්ත්‍රීය සංග්‍රහය (2011), සංස්කරණය ආචාර්ය මැදගම්පිටියේ විජිතධම්ම හිමි සහ තවත් අය... .- වරදිවෙල විජයසුමන හිමි, තෙල්දෙණිය: <u>පිටියේ දෙවියන්ගේ සම්භවය හා තදානුබද්ධ ජනශ්‍රැතියෙන් බිඳක්, වයි. කේ. තිස්ස බණ්ඩාර.</u> පිට 201. <u>පුවචන</u>: බුද්ධශ්‍රාවක භික්‍ෂු විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය (2012), සංස්කාරක ආචාර්ය කණුමුල්දෙණියේ චන්දසෝම හිමි සහ තවත් අය... .- බුද්ධශ්‍රාවක භික්‍ෂු විශ්වවිද්‍යාලය අනුරාධපුර; <u>යක්ෂ ආත්මයක් දේවත්වාරෝපණයෙන් පිදීම : පිටියේ දෙවි, වයි. කේ. තිස්ස බණ්ඩාර.</u> පිටු 132-158. තව බොහෝ පළකිරීමට ඉඩ තිබේ. හියු නෙවිල්ගේ සටහන් අනුව පී. ඊ. පී. දැරණියගල සිංහල කාව්‍යාවලිය පළකැර තිබේ. (Sinhala verse Ed.P.E.P.Deraniyagala, 1954 Govt.press Colombo). එම පොතේ සඳහන්ව ඇති පිටියේ දෙවියන්ගේ කවි සම්බන්ධ වාර්තාවේ සිංහලානුවාදය මෙසේය.

"මේ කවි කතාව ආරම්භ වන්නේ සොළීරට කාවේරි පුර විස්තරයෙනි. ඒ අනුව සොළීරට අගබිසවට පුතෙකු උපන් බව කියැවෙයි. දෛවඥයින් ප්‍රකාශ කරන්නේ ඒ පුතු ලංකාවෙන් දෙවිකෙනෙකුගේ පුදසත්කාර ලබන බවයි. එම කුමාරයා වැඩී සියලු කලා ශිල්ප ඉගෙන ගනී. ඉන්පසු ලංකාවට ගොස් දුම්බර ප්‍රදේශයේ පදිංචි වෙයි. එහිදී නාථ සුරිඳු මේ කුමාරයා අතින් පරාජයට පත්වෙයි. පෙරකල ලංකාවේ රජකෙනෙකු වූ සඳමහා නිරිඳු විශාල වශයෙන් ගොවිතැන් සඳහා යොමු වූ වත් විශාල ගල් පර්වතයක් නිසා එයට බාධා වූ බවත් කියැවේ. එය වාරිමාර්ග කටයුතුවලට දැඩි සේ බලපා තිබෙන අතර ගල කඩා දැමිය නොහැකි වී තිබේ. ඊට වසර ගණනකට පසු වික්‍රම්බා රජ සෙංකඩගල නිර්මාණය කරන විට දී ද මේ පර්වතය හරහා උමගක් හෑරීමට උත්සාහ කළ ද එය අසාර්ථක වී තිබේ. පසුව පිටියේ සුරිඳු බ්‍රාහ්මණයෙකුගේ වෙස් ගෙන සිහිනෙන් පැමිණ ඒ රජුට කියා සිටියේ බිලි පූජාවක් හා රන්කඩුවක් ඔහුට දෙන්නේ නම් (තනතුරක් ද සහිතව) ඔහු එය බිඳ දමන බවයි. යෝජනා කළ පරිදි පූජාව සකස් කළ අතර එදින රාත්‍රියේ ගල දෙවියන් විසින් පුපුරවා හළ බව සඳහන් වෙයි. පසුදින උදෑසන එය රජුට සැලකළ අතර එහි දේවාලයක් ගොඩනගන ලදි. එහි දී ගෝනෙකු බිල්ලට දුන් බවත් එම ස්ථානය වර්තමාන ගෝනාවත්ත නම් වී ලු. වසර කිහිපයකට පසු සෙනරත් රජතුමාට කිරිගෙන එන මිනිසෙක් ගඟ ලඟට නැවත පැමිණි විට දුටුවේ තම ඔරුව එහා ඉවුරට ගොස් තිබෙන බවයි. එවිට පිටියේ දෙවියන්ට යාඥා කළ විට බෝට්ටුව තනිවම (එය හසුරවන්නෙක් නැතිවම) මෙගොඩට පැමිණි බව සඳහන් වෙයි. පසුව රාජසිංහ රජු දවස, රජු කුණ්ඩසාලේ පදිංචිව සිටි සමයේ රජු ස්නානය සඳහා යන විට ගල් පර්වතයක් මග අහුරා තිබුණු බවත් එවිට " මෙය ඉවත් කළ හැක්කේ කාටද, පිටියේ දෙවියන්ට හැර" යනුවෙන් කියා ආපසු මාළිගාවට පැමිණ ඇත. එදින රාත්‍රියේ පිටියේ දෙවියන් ඔහුගේ අනුගාමිකයන් සමග එම ගල එම ස්ථානයෙන් ඉවත් කළා පමණක් නොව වෙනත් ගල් තලාවකට ඔසවා තබන ලදි. රජතුමා මෙය දැක එම ස්ථානයට පුද සත්කාර කරන ලදි. තවත් අවස්ථාවක දී දෙවියන් රජතුමාගේ දුන්න හොරකම් කළ අතර, එය දේවාලයේ දක්නට ලැබුණි. (එය කළේ රජතුමා මුවෙකුට විදීමට සූදානම් වන අවස්ථාවේ දීය). මෙම රජු වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ වශයෙන් හඳුන්වයි.

පිටියේ දෙවි මිනිසුන් යකුන් බවට ද පත් කළේ ය. ඔවුන් අතර <u>පල්ලේබැද්දේ ,වෙල්ලස්සේ බණ්ඩාර, අභයකෝන් මැතිඳු, හාරගමරාළ, පායින්ගමුවේ බණ්ඩාර, උඩුවෙල රාළ, දැඩි අප්පු, පරගම්මන නයිදේ, කුමාරසාමි, මුත්තුසාමි, බිලිඳුසාමි, හා පුලියසාමි</u> යන අයයි. ඔවුන් ගැන වෙන විස්තර සඳහන් නොවේ. කවියකින් සඳහන් වෙන ආකාරයට දොඩන්වල කිවිඳු විසින් කවි 159 කින් යුත්තව පිටියේ සුරිඳු පුවත නිර්මාණය කරන ලද බව කියවේ. එය නරේන්ද්‍රසිංහ රජුගේ අණ පරිදි කළ බවත් පැහැදිලිය. ඒ රජුගේ රාජ්‍ය කාලය ක්‍රි.ව. 1707-1739 විය. එම කවි නරේනද්‍රසිංහ රජුගේ කාලයේ පළමු භාගය තුළ දී ලියවෙන්නට ඇත. මා සතුව මේ කවියේ පිටපත් කිහිපයක් තිබේ. එකක පද්‍ය 169 හා අමතර කවි 9 කින් යුක්ත ය. එය රජු වර්ණනා කරමින් ලියැවූවකි. අනෙක් කවි 171 හා ඉහතින් සඳහන් කළ අමතර කවි 09 ක්ද ඇතුලත් ය. තවත් එකක කවි 162 ක් ද අමතර කවි 03 ක් ද වේ. මෙයින් පෙනෙන්නේ මෙම කවි පෙළ කොතෙක් වර්ධනය වූවා ද යන්නයි. පළමුව සඳහන් කළ කව්පෙල සියවසකට වඩා පැරණිය. අනෙක්වා ද නූතන ඒවා නොවේ ." (Sinhala verse Ed.P.E.P.Deraniyagala, 1954 Govt.press Colombo, p.25-26).

පිටියේ දෙවියන්ගේ කවි පුස්කොළපොත් සතරක් මා දැක තිබේ. එයින් දෙකක් හපුගොඩ පිටියේ දේවාලයේ කපුරාලකම කරන එක් පාර්ශවයක ප්‍රධානියෙකු වූ පුංචිබණ්ඩා කපු මහතා සතුව තිබේ. ඒවා අධ්‍යයනය කිරීමට අවස්ථාවක් නො ලැබුණි. ඉතිරි පිටපත් දෙක අනෙක් කපු පාර්ශවය වන අප නිවස සතු වෙයි. එයින් එකක් දැනට කපුරාලකමේ යෙදෙන අබේකෝන් මහතා සතුවත් අනෙක් පිටපත පර්යේෂණ මට්ටමෙන් මා සතුවත් තිබේ. පසුව කිය වූ මේ පිටපත් දෙක ඉතා හොඳින් කියවා

සංසන්දනය කළෙමි. පිටපත් දෙකේම කවි 463ක් විය. මෙයින් දැනට මා සතුව පවතින පිටපත ක්‍රි.ව.1903 අප්‍රේල් මස 20වැනි දින පිටපත් කළ බව අවසාන පත් ඉරුවේ සඳහන් කැර තිබේ. එසේ පිටපත් කිරීමට උපකාර කැරගෙන ඇත්තේ ඉහත පැරණි පිටපතකි. ඒ අනුව වඩාත් පැරණි පිටපත අබේකෝන් මහතා සතුව තිබේ. මා විසින් පිටපත් කරනු ලැබූ පරිගණක යන්ත්‍ර පිටපතක් පසුගිය වසරේ දිනක පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සිංහල අධ්‍යයන අංශයේ සේවාර්ජිත මහාචාර්ය පී.බී.මීගස්කුඹුර ගුරීන් වෙත ඉදිරිපත් කළෙමි. එතුමා එය මහත් ඕනෑකමකින් යුතුව මුල සිට අග දක්වාම කියවා බලා සංශෝධනය විය යුතු තැන් හා අඩුපාඩු සකසා දුන් බව ගුරු බැතියෙන් මෙහි සිහිපත් කරමු. මා පිටපත් කළ කවි හාරසිය හැටතුනකින් යුත් පිටපත, පිටපත් කිහිපයකට අයිති එකතුවක් බව එතුමාගේ නිරීක්ෂණ අනුව හඳුන්වා දුන්නේය. දැනට පිටියේ දෙවියන් ඇදහීම සම්බන්ධයෙන් පවත්නා සියළු පුදපූජා හා සිරිත් විරිත් හා ඒ ඒ දේවාල ආශ්‍රිත තොරතුරු මැයෙන් පුළුල් පර්යේෂණයක යෙදෙන බැවින් වැඩි විස්තර මෙහි නොදක්වමු. එහෙත් මහාචාර්ය පී.බී.මීගස්කුඹුර ගුරීන් විසින් අප වෙත හඳුන්වා දෙන ලද පිටියේ සුරිඳු පුවතේ දොඩංවල කිවිඳුන් විසින් රචිත කවි 159ක් වූ කාව්‍යාවලිය මෙහි පළ කිරීමට සිත් විය. මධ්‍යම පළාතේ සංස්කෘතික කටයුතු සම්බන්ධයෙන් විවිධ ක්ෂේත්‍ර කෙරෙන් කටයුතු කෙරෙන එම දෙපාර්තමේන්තුවෙන් පළ කරනු ලබන සාරවී සාර සංග්‍රහය තුළින් මේ එළි දක්වනු ලබනුයේ මැදරට එක්තරා කලාපයක ඓතිහාසික දේව සංකල්පයක තොරතුරු බිඳක් හඳුන්වාදීම වෙනුවෙනි. මහාචාර්ය තිස්ස කාරියවසම් ගුරීහු සිය සිරිලක දෙවිවරු කෘතියේ ද එංගලන්ත බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ පුස්කොළ පොත් තුළින් උපුටා ගන්නා ලදුව පිටියේ දෙවියන්ගේ කවි පොත යටතේ කවි 83ක පද්‍යාවලියක් පළකැර තිබේ. එම කවිවලට අනුව එහි තුන්වන කවියේ මේ පද්‍යාවලියේ කවි 169ක් බව සඳහන් වේ. ඒ බව හියු නෙවිල් ද උපුටා දක්වමින් පී.ඊ.පී. දැරණියගල මහතා පළකැර තිබේ. එවිට දොඩංවල කිවිඳුන්ගේ මූලික කාව්‍යාවලිය එක් කවි පෙලෙක 159ක් බවත්, තවත් කවි පෙලෙක 169ක් බවත් යන්න අවධානයට ලක්විය යුතු කරුණකි. සියලුම පුස්කොළ පොත් අධ්‍යයනය තුළින් පිටියේ සුරිඳු පුවත තෝරා බේරා ගැනීම තවද කල් යා හැකිය. ඉදිරි පර්යේෂණ සඳහා මෙහි දැක්වෙන පද්‍යාවලිය ද ප්‍රයෝජනවත් වේ යැ'යි යනු අපගේ හැඟීමයි.

01. පිරිසිදු ගුණ සිසිල්
සමතිස් පෙරුම් — නිදුල්
මොක් වෙරලින් — ලකල්
වදිම් මුනි කිරි සයුර හැම — කල්

02. ලදිම් දින සුර — මග
අදම්බව හිම් — ගලතග
සෙවුම් කල අප — මිග
සදම්මා මුදුන සදම් — සුරගන

03. සෙවු මුනි සඳ — නිමල
උලැහි මුළු ලොව තුබ — තල
සිවුල් කැළුමැති — උදුල
වදිම් සඟ තුරු නිතර — හැමකල

| | | |
|---|---|---|
| 04. | මෙලෙස දුම් කෙලි | පුද |
| | ලැබ තොස වෙමින් මන | නද |
| | පිටියේ දෙවිඳු | සද |
| | රකින් ආතුර දුක් මුදා | සොද |
| 05. | තිසුල විකසිත | පොතත |
| | විදුර විකසිත | බරණෙත |
| | මුසල විය | කමලත |
| | මෙදෙව් වී සත රැක කෙරෙ | සුබසෙත |
| 06. | පිරි ඉසුරු | සහසක් |
| | විකුමෙන් සදිසි | සරයක් |
| | පතල ලොව | අනසක් |
| | කියන් පිටියේ සුරිඳු | පුවතක් |
| 07. | එසුරිඳු සිරි | මහත් |
| | තදතෙද විකුම් | බලවත් |
| | මකියම් සිතට | යුත් |
| | සයුර දිය මෙනි අබළුවෙන් | ගත් |
| 08. | සදිසි තැන | සුරගුරු |
| | පියතුනි මෙලොව | පිවිතුරු |
| | ඇතත් දොස මෙහි | තුරු |
| | හලොත් යෙහෙකැයි මේ සිතිං | ගරු |
| 09. | සුරපුර මෙන් සුසඳුනු නොව | වෙනසක් |
| | ගජ හයසෙන් මෙතෙකැයි නැත | පමණක් |
| | නෙක ඉසුරෙන් පිනවන දනවන | මනසක් |
| | විය මෙලෙසින් කාවේරිනම් | පුරයක් |
| 10. | එපුරාඅසිරි තිරයන | ලෙසදෝ |
| | බැහැර දුසිරි තිරයන | ලෙසදෝ |
| | සපිරි විලස සිවු මුව ඉදි | කලදෝ |
| | පවුරු විලස බබලයි දිසි | කලදෝ |
| 11. | කලන දන දන කැළුමෙන් සිලි | ඉසිලි |
| | ගල තිබෙන සිහිලැබ පිරි | නිමලී |
| | ගෙල බමන බිඟු දැල් කව | එ පුලී |
| | දලා එ පුර දිය අගලින් | බැබලී |

| | | |
|---|---|---|
| 12. | දිලෙන එපුර මිනි බිතුමෙන් | පැහැසර |
| | පෙනෙන උයද රිවි පිලිසිඹු | මනහැර |
| | දරණ පුරඹ උවනක සුපිපුන | සර |
| | බලන වැත්න වැද වැද එමදුර | තුර |
| 13. | සොබනා එපුරෙහි ශදිසක | සිතගේ |
| | බඳිනා රංදද රංමිනි | යටගේ |
| | ලෙලෙනා හැම සඳ මද | සුලගේ |
| | යනෙනා මෙනි තුඹ කුස සුර | සෙනගේ |
| 14. | පුර මේ දෙපසෙහි බැඳි රං | තොරනින් |
| | දුරුවේ ගනදුරු විහිදෙන | කිරනින් |
| | සරුවේ සල්පිල නන්දන මිනි | බරනින් |
| | දිනු මේ සුරපුරයටත් සිය | ගණනින් |
| 15. | අවටින් බැඳි රන් පිලි මිනි | පවුරේ |
| | සුපසම් දෙසදුම් සහතුරු | නිකරේ |
| | පිපිනම් කුසුමන් සුවඳිං | විසිරේ |
| | ගෙවුයම් මෙලෙසින් සසදුන | එපුරේ |
| 16. | දිගු නිල් තෙපුල් පිපි සර | වතිනා |
| | එහි ලොල් හැමකල් සහතන | තෙවුනා |
| | පැහැදුල් සුනිමල් රැලි සළු | පොටිනා |
| | පුරවිල් සිරිපුර කල්සිරි ගති | නිතිනා |
| 17. | විදුලිය සරහු ගණ රන් | ඔරුදු |
| | උදුලිය තුළ ද කොකවැල | සුසදු |
| | කොපුලිය ගිංලි මද වැසි පොද | සිනිඳු |
| | විපුලිය ගජමේ කුළු සිරි | ඔරුදු |
| 18. | බැඳි රන් රසු දැල් නද දෙන | සිතගේ |
| | ගණ රම් කම්මිනි කලනින් | සරගේ |
| | විලසින් නොනවැත යන සිදු | තරගේ |
| | මෙලෙසින් සැදි එපුරෙහි අස්සෙන | ගේ |
| 19. | අවිනත් නිය පදුරෙන් | සිතුවිලිසේ |
| | රුපුනම් ගජකුඹු උපුරණ | වෙසෙසේ |
| | විකුමෙන් කෙසරුන් විලසින් | නිලතොසේ |
| | මතයෙන් මෙතකැයි පවසති | කෙලෙසේ |
| 20. | සමර විජය තුති පසතුරු | නාදේ |
| | පවර ගජම් මිනිහය රසු | නාදේ |
| | නොහැර යනෙන දිසි රිය සක් | නාදේ |
| | එපුර නිතර විය එක නින් | නාදේ |

| | | |
|---|---|---|
| 21. | සපත් මෙලොව ඇති සියළුම | තැන යා |
| | සපත් විලස සවුසිරි | අපමණයා |
| | පුවත් නොහැර එපුරෙහි වෙන | වෙනයා |
| | කියත් අනත නිමවන බැරි | දැනයා |
| 22. | දිලිනන් තද තෙද තින් යුත් | සුය |
| | තිලිනෙත් දෙන සුරතුරු | සිරිතුරිය |
| | තිලිණම් රුප නරිඳුන් ඔද | පැපීය |
| | සොලිනන් තිරිදෙක් පුර | කාවේරිය |
| 23. | කිරිසිදු තොක මුතු හර සුර | ගංගා |
| | පිරිසිදු දිසි යසසින් මන | රංගා |
| | ගිරිනිදු දිරිතර විකුමෙන් | රංගා |
| | එනිරිඳු රිවිකුල කිරුළකි | තංගා |
| 24. | හසරද එනිරිඳු එකුමැති | සොඳුරු |
| | පැහැබද තෙද තුඹ පොවමින් | නෑරු |
| | රුපුරද කර සර මුවරද | පඬුරු |
| | හැම සද ගෙන එවැජඹෙතියි | සිතමහරු |
| 25. | පසන් එනරනිදුගේ | සුවිසේස ය |
| | සයින් මෙමුළු දිය කල | සුවිලාසය |
| | ගොසින් ඉසුරු සිතමින්න | කෛලාසය |
| | අදුං ගිරට නැගුනේය | විලාසය |
| 26. | තියමින් අඩුවැඩි උවහොත් | ගතිනා |
| | වියතුන් අසුබැයි පවසති | එයිනා |
| | එසෙයි ලවගය කද බර | නුවනා |
| | වෙරදුන් රුසිරට එවනක් | කොයිනා |
| 27. | දිය රන් විකුමෙන් රුපු ඔද | බින්දා |
| | වෙසෙසින් යසතෙද දසදෙස | අන්දා |
| | තිලෙනෙන් සුරතුර සිතුමිනි | මෙන්දා |
| | මෙලෙසින් වැජබෙන සඳ නර | නින්දා |
| 28. | හසවන් නරනිදු තණ අවනත | පුත්තරවු |
| | රුසිරෙන් බබලන විලසින් | දෙව්දු |
| | එරදුන් අගබිසවුන් කුස | සුමුදු |
| | සුපසම් කුමරෙක් උපනිය | පසිදු |

29. වැඩ ඉඳ නරනිඳු සිහසුං     මුදු නේ
එම සඳ නැතකැදුරන්     ගෙන්වමිනේ
මනනද කුමරුගේ පින්බල     සොඳිනේ
කෙලෙස ද පවසවු වදහල     ලෙසිනේ

30. තබමින් බොළු පඬිගෙන     විමසමිනේ
බලමින් නැකතුත් තොරතුරු     එදි නේ
දිවසින් දුටු විලසින් නොව     ලසිනේ
මෙලෙසිං පවසති වදහල     බසිනේ

31. වික්මැති රුපු ඔද බිඳ හැර     නිතිනේ
දික්යට ගෙයි යස දද     බඳවමිනේ
රක් දෙවිලසින් සුර සිරි     ලදිනේ
ලක්දිව වැජඹෙයි කෙලි පුද     රැගෙනේ

32. මෙලෙසින් නැකැත් ඇදුරන් කී     බසේ
නිරිඳුන් සිත කම්පාවිය නො     ලෙසේ
විගසින් කිරි මවු ගෙන්වා     සලසේ
දරුපෙම් කර වඩමින් නෙත     විලසේ

33. සත්මස පිරිසඳ එකුමරු     සසොඹන
එත් නැකැත් ඇදුරන් කිවු සුබ     මොහොතින
බත් කවමින් කරවානෙක     මඟුලෙන
සිත්ලෙස වැඩනුය නව සඳ     විලසින

34. සොඳුරු පහන් සිළු විලසින්     දුල්ලේ
කුමරු මඟ කෙලෙමින් නො     පැකිල්ලේ
මියුරු තෙපුල් පවසා සිවු     මැල්ලේ
දෙගුරු තමන්වෙත කරවති     ලොල්ලේ

35. ඇවිත් කුමරු කෙලි මඬලෙහි     සිටනා
සුරත් යුවල ලෙලවා නිසි     ලෙසිනා
කියත් නොයෙක් සුරතල් පිය     බසිනා
දුටොත් එ රුව මැවෙති     කෙලෙසකිනා

36. කියමින් සවනට මෙලෙසින් ගී     සින්දුව
සුරතින් ගෙන විසිතුරු මල්     පන්දුව
ගසමින් ඔබනොබ නොකර     අමන්දුව
කෙලිමින් දුටු සත නෙත ලොබ     සින්දුව

| | | |
|---|---|---|
| 37. | නිදොස රුවින් බබලන මත් | මදසේ |
| | සතොස කරණ හැම සඳ දුටු | විලසේ |
| | මෙලෙස කුමරු වැඩෙමින් පින් | පිඬසේ |
| | සොළොස් වයස පසුවුනු සඳ | වෙසෙසේ |
| 38. | සසොබන එකුමරු සඳ මන | නන්දා |
| | නිසිතැන යනසුරු සුරගුරු | වෙන්දා |
| | වියරන විදි සඳ ලකර | පබන්දා |
| | දැකගෙන සවුසත අතඹුල | මෙන්දා |
| 39. | කගපත සුරතට ගෙනසිට | කුමරෑ |
| | ලෙලවන තුබගැබ විදුලිය | අයුරෑ |
| | මුනලත වරනිඳු බඳවත් | සිඳුරු |
| | පවසණ ඔහු අවි සිප්සිරි | කවුරෑ |
| 40. | සොඳුරු කුමරු නිසිකොතවිය | රැගෙණා |
| | විදුරු බිතටවන් මුනලන | රොසිණා |
| | සිඳුරු කෙරෙවුන මද | විගසකිණා |
| | කවුරු කියති ඔහු විකුමන් | එයිණා |
| 41. | අතට රැගෙන එකුමරු | සිටවාපේ |
| | දුරට පෙනෙන තෙක් සදමින් | රූපේ |
| | එවිට විදිති නොවරද ශර | කීපේ |
| | සිරට ඔවුන් සරිකොද මුළු | දීපේ |
| 42. | මෙසේ ඔවුන් සවුසතරෙහි | පුරුදුව |
| | මෙසේ කරව උරසදමින් | සිරිදුව |
| | යසේ සඳුන් දිගතුන් කැබු | ඔරුදුව |
| | මෙසේ කුමරු සුරතුර මෙං | පසිදුව |
| 43. | සකල භූමතල විතන යස ජය කෙහෙලි දිගුයට | එල්ලවා |
| | නිමල දිඩ හුධ ධරනිධර සිරි වස්ත්‍ර නිබ නැත | තුල්ලාවා |
| | විපුල වික්‍රම රාම මන්මථ රූපය වුව | නදුල්ලවා |
| | නිමල රිවිකුල හේම මන්දිර ධීප සොලී හිමි | එල්ලවා |
| 44. | වැල්පොතකල් රජ ඉසුරු විද ලොබව නර ලොව | සපවිපුල් |
| | විලසසක්රද පසිඳු දෙව්සිරි ලැබ උදක් තද තෙද | නිමල් |
| | පිරිනොයෙක් සවුසිරි අලකපුර පසුකරණ විලසිං | නිමල් |
| | මෙසිරි ලක්දිව තමන්හට වැජබෙන්නට අවසර දැක | එකල්ලේ |

45. සුර ගගිං විසිරෙන තුරඟ රඟ සිනිඳු සුසළු   වඩමිනා
තිසිලෙසිං විසිතුරු කණක කර්බරණ   ණුපුරායෙනා
නව රුවන් වියති කිරුළු දරමින් උයදගිරි   දිනකරවෙනා
මෙවෙලෙසින් සිවු සටක් බරතින් සදි එසුරිඳු   සතොසිනා

46. ලතර දිඟුබිත සපිරි ගණඳුරු බිදැර හෙලිකර දියත   යසසේ
නොහැර විලබුන් කමළු පුල්වත නෙක සතුටු කරවමින්   නොලසේ
ඇඹර ගැඹ සිට රැස පෙරටු කොට ගමන්ගත් දින රජෙක්   විලසේ
එවර සවුසිරි සපිරි මෙලකට විසුරනිඳු වඩමවා   සතොසේ

47. විපුල ලකගණ පැලඳි උරබිත දිමුතු මුතු හර   විලසිනා
තිමල රැල්ලේ පතල මහා වැලි ගඟ අසල සදි   වෙසෙසිනා
ලකල කෙත්වත් සුසැදි දුම්බරපිටියේ දකිමින්   සතොසිනා
එකල අනසක පතලකර එහි වසන සඳ   එසුරිඳුමනා

48. ඈත කලෙක සිට සමතිස් පෙරුමන් පුරා නොයෙක් විලසින්   දිමුතු
බීතකරන මරුවන් බිඳහැර බුදුබව පතා එන මෙයින්   මතු
නාථ සුරිඳු සඳ වැඩසිටි සෙන්ගඩගල්පුර ගොස් සුරතේ දිනිය   යුතු
දෝත මුදුන තබමින් වැද සිට කිවු පිටියේ සුරිඳුන් වැඩිය   නතු

49. එබසට මැතිඳුම් තද උදහසයෙන් වැඩසිට රන්කග ලෙලවි   මිනේ
යුදයට සරෙමින් නෙක තම සුරසෙන් රැස්වෙන ලෙස වදහල   බසිනේ
ගෙනතට අවි නන්විදු කිඳු විලසින් එලිකොට දිඟුබිත   නොවනේ
මෙලෙසට ඇවිදින් රුපුවිග තෙපුලෙන් දිටියෙන් මෙතෙකැයි නැත   පමනේ

50. යුගත පවන් වැඳ එන සිඳුමෙන් ගොඩ නෙක සුරසෙන් තම   පිරිවරමින්
දිගත දිගුත් පසතුරු ගොසයෙන් තුඹ ගැඹ ගුගුරණ සෙනෙහඩ   තරමින්
දිගත නිතින් අවිනත ලතුසින් හෙලිකර එන සුරසෙන්   පිරිවරමින්
දියත ඔවුන් එනයුධයට සිටින්නට ආ කොදමිය මොහු   බලපාමින්

51. මෙලෙස සඳ මග බැන උරදී තිසි දුම්බර දි කඩ ඔවුහු   දුවලා
යුදට වැදී සුරසෙනග බෙදී අවිපහර දිදී නැගි පුලුගු   දුලා
විලඳ රිදී නැවිලතුරු දිදී යනලෙස සුසදි රුපු   සිරිසිඳලා
විජයලදි ජයකෙහෙලි බැඳි අටදිගු යට සොලිනුපති   මුලා

52. සිපිරි කලපති යස තිමල සොලි රජු නැඹලා යුධ කරණා   කලා
පසුබැසලා නොමගොස් අතිලා එන රුප දැකලා සිට සරොස   වෙලා
රැගෙන දුලා කොත විය එකලා රණමැද වැදලා ඇත දමන   කලා
බිය වැදලා හදවත වෙවුලා සිරිපද වැඳලා වැතිරෙති   එකලා

53. නීත මිතුරුකම් නොමැති සතුරු සෙන් මැදට වැද විකුමෙන් පසිඳු
ගාත බිඳරගෙන සිවුපා මරමින් ගැසු එසඳ පිටියේ සුරිඳු
බීතවෙමින් සුරසෙන් එසඳහි පසුවුන දුටුගනදුරු මෙන් දිනිඳු
නාථ සුරිඳු යුදයෙන් පැරදී ගොස් වැඩිය එවිට පවුබියො රුදු

54. ජයගෙන රුදු විරිඳුන් ඔද බින්දා
දිගගෙන යසහර උරෙහි පලන්දා
අපමන දෙවියස සිරිවිදමනත උරෙහි පලන්දා
වැජඹෙන සඳ පිටියේ ඒ සුරින්දා

55. පෙර සිරිලක පත් සඳ මහා නිරිදෙක්
වැරසරගති මහනෙත් ගනිමින් එතොසේ
මනහර ගුරුදෙනියට වැඩ ලොපයක්
තිරසර කෙතට බැදිමින් අමුනක්

56. වැරිසර මහාසෙන් සෙබළු විලසේ
මනහර ඇලපොළු ගසමින් නොලසේ
ගෙනහැර දියකඳ එනලෙස වෙසෙසේ
තුඟුතර සිරකුත් සිබියෙ සරසේ

57. දැකලා ගිරිකුළු සිටිනා මානය
බිඳලා ගෙනියන ලෙස ඇලමාය
කරලා නෙක වෑයන් අසමානය
හැරලා ගියවුන් බිදෙමින් මානය

58. එයින් පසුව බෝකල් ගිය දවසේ
ගියෙන් එසඳ මහරජ පුර නිදසේ
උතුම් විකුඹා නරනිඳු වෙසෙසේ
වෙමින් මෙලක රජ සැපතට නිදොසේ

59. මන්වැඩ නෙක රුදු විරිඳුන් ජයගත්
දුන්තුඩ යස තුතියෙන් ශදි බලවත්
පින්පිඩමෙන්නෙක ශපති අගපත්
සෙන්ගඩගල් පුරකරවා සිරිමත්

60. තුෂාරක සේ තුඟු බිතපිරි යසසේ
පවර විකුංඹානරනිඳු නිදොසේ
නොහැර මෙලෙෂ එකසක් කර මෙසෙසේ
එපුර යෙහෙන් වැජඹෙන සඳ මෙලෙසේ

61. සුපසන් නරනිඳු දිනයක සොඳිනේ
අහසින් බට සුරිඳුන් සිරි රැගෙනේ
මැතිඳුන් නෙක පිරිවරමින් එදිනේ
සිහසුන් මුදුනත වැඩ උන් යදිනේ

62. මැතිදෙක් එසබෙන් නැගිසිට නැවතත්
තෙවිටක් වැඳ බැස තබමින් මුදුනත්
පෙර ලක්දිව සඳ මහා රජු සිරිමත්
අමුණක් බැඳ ගුරු දෙණියෙහි බලවත්

63. මහසෙන්ගෙන බිඳුවන සඳ ඇලෙකා
සරසිං සිටියේ තුඟුතර ගිරෙකා
එසෙයින් නොහැකිව ගෙයසෙන් නොයෙකා
මෙලෙසින් එ සැලකල බසෙකා

64. එපවත් අසමින් නරනිඳු සොඳුරු
බලවත් සිරිලකයෙන් ඇර මහරු
නෙකතක් කරගිර කරනට සිඳුරු
මදකුත් නොපහැකි විය පෙර අයුරු

65. මැතිඳුන් ගෙනගොස් නරනිඳු වෙත සිටගෙණ
එතමන්හට බැරි බව කිවු වෙසෙසිණ
නිරිඳුන් සිත කම්පාවිය නොපමණ
එදුකින් පසුවෙන සඳ මෙම විලසිණ

66. දනවන පිනවන කන කම්මානේ
බබලන හැම සඳ මිනි වැට පහනේ
සදමින් දෑ සඳුන් කුසුම සමානේ
සත වෙත සඳ එනරිඳු සිරි යහනේ

67. සුපසම් බවු දිසි බමුණකු වෙස් රැගෙනා
ඇවිදින් පිටියේ සුරනිඳු සිටිනා
නිරිඳුන් හට පෙනෙමින් නොවල සිනා
මෙලෙසින් සීනෙන් පවසයි එදිනා

68. මෙලෙසින් පවසා වැඩි සඳ සුරිඳුන්
පසුදින උදයෙන් නැගී සිට නිරිඳුන්
සසොබන තැනයෙන් යුතුවන ගනිඳුන්
සතොසින් තම වෙත ගෙන්වා මැතිඳුන්

69. නිරිඳුන් දුටු සීනය වදහල සඳ
මැතිඳුන් අපමන සතුටුව එමව සඳ
එලෙසින් කෙලි පුද සර දෙන ලෙද
දෙවදැන් අවසර කිවුසිරි පද වැද

70. එබසට නරනිඳු වඩිසින් සතොසේ
මැතිහට අවසර දුන් සඳ විගසේ
එමවිට ගුරුදෙණියට උන් පිවිසේ
මෙලෙසට පවසති කෙලිපුද වෙසෙසේ

71. සතමුණකුත් සාලෙන් රැස් කරමින්
පිය බොජොනුත් තිසි රස මසවුලෙන්
කගපතකුත් වදහල ලෙස තනමින්
නෙක පුදවන් සරසා දුන් මෙලෙසින්

72. සුපසන් එසුරිඳු විකුමෙන් තදතෙද
දිනිඳුන් දකිනට නොහැකිව බියවැද
විලඹුන් හැරගනිමින් සිය රැස්කඳ
ගියමෙන් අමරඟ පත්විය එමසඳ

73. මනහර පියියේ එසුරිඳු එදිණය
වැරසර පිරිවර යක්සෙන් රැගෙනය
තුඳ තරගිර පොඩිකරමින් නැරය
වැරසර විකුමෙන් දුන් කඩුපාරය

74. මෙලෙස තමන් තදතෙද බලපෑලා
දිගස දිඟුන් උරමින සුවිසාලා
එයස පසන්ගෙන එෑ මුතුමාලා
කෙලෙස කියන්ඩ ඔහු විකුමෙන් පෑලා

75. ඇවිදින් පසුදින උදයේ මැතිඳුන්
දකිමින් කල තද තෙදයෙන් බල සුරිඳුන්
එනමුත් ගොස් වැඳ බැස දැක සුරිඳුන්
වෙසසින් කිවුකල විකුමන් දකිමින්

| | | |
|---|---|---|
| 76. | පීනවා නරනිඳු සිත කල් | විකුමට |
| | තනවා උළු කෝවිල ඒ ගල | පිට |
| | බඳවා සුදු උඩුවියනුත් නිසි | කොට |
| | අරවා සුර ගගන රගසේ | තිරවට |
| 77. | අහසින් බට සුරවිමනක් | ලෙසිනේ |
| | වෙසෙසින් දෙව් විමනක් | කරවමිනේ |
| | නොමසිත් පසතුරු ගොස | පෙලහරිනේ |
| | ජයරත් කග එහි වඩිමින් | එදිනේ |
| 78. | සසොබන ගුරුදෙණියේ වෙල | සොදිනා |
| | කරවන ලෙස මැතිසෙන් සල | සම්නා |
| | අපමණ නැති සුරිඳුට | පවසමිනා |
| | මෙලෙසින් නරනිඳු වැඩියයි | එදිනා |
| 79. | රොසේ කරණ රුපුසෙන් මද | බිඳිමින් |
| | මෙසේ නොයෙක් තද තෙද බල | පාමින් |
| | තොසේ කෙරෙමි සවුසත නිති | රකිමින් |
| | මෙසේ සුරිදු ලක කෙලි පුද | ගනිමින් |
| 80. | පෙන්නා තම යස තෙද බල | මෙලොවට |
| | ගෙන්නා කුළු සරකුන් | ගුරුදෙණියට |
| | දුන්නා කිරි දෝ ගැනුමට | සතහට |
| | මින් පසු විකුමෙන් කොද | මෙලොවට |
| 81. | දකිමින් සුරිඳුගේ විකුමන් | තබුළු |
| | සතොසින් ගම්වැසි රැස්වී | සියළු |
| | දෙමු දැම් මුළුතැම් මඩුවක් | ලකුළු |
| | කියමින් පුදවත් සරසති | සෙබළු |
| 82. | තනමින් දිග පුළුලැති මහ | මඩුවක් |
| | බඳිමින් උඩ පිරි සොඳ සුදු | වියනක් |
| | ලවමින් ගොම පිරිබඩ ගෙන | එනොයෙක් |
| | අඟනන් ඉස්නානයකර | සොලසක් |
| 83. | දිගස ඇඳන පිරිසොඳ සුදු | පිරිවට |
| | යෙල සමුණක් ගෙන්නා වී | එතනට |
| | නිදොස මඟුල්බෙර ගසමින් | එමවිට |
| | සවස පටන්ගත්තුව වී | කෙටුමට |

| | | |
|---|---|---|
| 84. | උවෙන් එතනව තුඟු ගෝනා | වත්තේ |
| | කතුන් ඇවිත් ඔහු මරමින් ගතඟු ගෝනා | වත්තේ |
| | එතැන්පටන් සිට ගෝනා | වත්තේ |
| | මෙතැන් තවමළු ම නාමය | පැවැත්තේ |
| 85. | තොස්කර ගෝනාගෙන ගොස් | මඩුවට |
| | මස්කර පිස රස බොජුනුත් | එමවිට |
| | විස්තර කරදී කෙලි පුද | දෙවිඳුට |
| | රැස්කර ගත්තුව සෙත්පිරි | එමවිට |
| 86. | ඊන්පසු බෝකල් පසුවුනු | කලටා |
| | සෙන්කඩගල් සෙනරත් | නරනිදුටා |
| | සුංකිරි ගෙනියන සෙබලෙක් | එමවිටා |
| | මන්තොස කර බැසපිය | ගන්තොටටා |
| 87. | එද සෙද ඔරුව ද එගොසින් | තිබුනේ |
| | වැදතද බියපත් සෙඹළුන් | වෙමිනේ |
| | වැඳ වැද පිටියේ දෙවිදුට | නොමිනේ |
| | යද යද සිටිනා සඳ මෙම | ලෙසිනේ |
| 88. | නුඹේ දුවන සක්වා යුග | ලෙසටම |
| | ඉබේ ඔරුව ඇවිදින් ඔහු | ලඟටම |
| | ලොබේ වඩා එහු ඇවිදින් කරවවු | එගොඩටම |
| | තිබේ එය යමකු පස්වා | දහසමම |
| 89. | මෙලෙස එසුරනිදු යසතෙද | බෝමය |
| | කෙලෙස කියම් එක මුවකින් | පේමය |
| | නිදොස නැනැති තැන නාසින | සේමය |
| | සහස මුවෙන් කිවුවත් බැරි | සේමය |
| 90. | කිරිසිදුකොද යසසිං අටදිඟු බිතකල | මෛවිරාජ |
| | දිරිතර රුපුසෙන් බිදහැර බලවික්‍රම | නැබෙවුනීජ |
| | පිරි ඉසුරෙන් සදිසි සුරිදු දෙනපිලිනට එතුර | රාජ |
| | සිරිලක රජසිහ රිවිද වැජඹෙන සඳ සිංහ | රාජ |

| | | |
|---|---|---|
| 91. | විසුල තරඟ නිකර දිමුතු පිරි සිද කුළු වෙමු | නිඹදෙ |
| | නිමල එමහාවැලගග අස ශදි සොද නදුං උයන | ලෙදෙ |
| | ලකල කුණ්ඩසාලය නම් පුරයෙහි සුරිඳු සේ | පබදේ |
| | නැබල රාජසිංහ නිරිඳුන් සමයෙක එහි වසන | සඳෙ |
| 92. | කලා නදන කැළුමෙමු දිසි සොඳුරු සිතිඳු | සෙවනැල්ලේ |
| | තලා වතු ඔයෙන් මෝදර කරඹ සුස දුනි | සිවිපුල්ලේ |
| | ගලාතිබෙන සිහිලැබ පිරිසොඳුරු නානුමුර | ඇල්ලේ |
| | දුලා එහිම්සඳ දිනයෙක දිය කෙලියට වැඩ | ලොල්ලේ |
| 93. | තුඟු තුල් ගිරිකුලක් නානුමුර සිදුවෙන තැන තිබු | ලෙස |
| | මිහිපල් දැක වදාරමින් එහිරු වෙන කරණ | විලස |
| | සුවිපුල් පිටියේ සුරිඳුං මිස කොද සමතෙලක් | දියකුස |
| | මෙතුපුල් පවසා සමුඳුන් වැඩියයි නුවරටම | සවස |
| 94. | සිඳලා රුදු විරිඳුන් ඔද ජයගත් සුරන්ද්‍ර | තොසිනේ |
| | වැඩලා එතනට එමවිට යක්සෙන් පිරිවර | රැගෙනේ |
| | ගොඩලා ගිරිකුල තබමින් අසල තිබුනු සල | මුදුනේ |
| | කරලා මෙවිකුම් තද තෙද ගිය සඳ ඔහු නිසි | ලෙසිනේ |
| 95. | පසුදින උදයේ රජසිංහ නරනිඳු අසම්ං | එපවත් |
| | වඩමින් සිවුරඟසෙන් සමගිං දැක කල විකුම් | මහත් |
| | අපමණ ජයතුති කරමින් දෙවුවයි නෙක පඩුරු | මුත් |
| | මෙලෙසිං තෙද බල පෑ සුරිදෙක් මුළු ලොව ඇද්දී | වෙත් |
| 96. | සුපසන් රංසිංහ නිරිඳුං දිනයෙක වැඩ හි | මනුරු |
| | කියමින් නෙක මැතිඳුන්හට කොටුපත්වල සිටිනා | අයුරු |
| | යවමින් මහත් සෙන් එවනය එලවන විලසිං | නොවසර |
| | තඹමින් දුනුහී අහකිං වැඩසිටි සඳ තැනෙකෙක් | සොඳුරු |
| 97. | එසඳ මුවෙක් පැනපිය නරනිඳු සිටි කොටු | පංතියට |
| | පබඳ එහිමි නොමදැක රංදංනත එසිර අතට | ගන්ට |
| | කවුද මෙලෙස පිටියේ සුරිඳුන් මිස තෙද බල | පාන්ට |
| | මෙලෙස වදාරා කෝවිල බලන ලෙසට යෙදුනි | යන්ට |
| 98. | ගිය සෙබලුන් දොර අරවා බලමින් දෙව් විමන | අයුරු |
| | තෙද විකුමෙන් ගෙනත් තිබුනු එරන් දුන්න දුටුව | සොඳුරු |
| | ඔහු ඇවිදින් වැද බැස සිට නරනිඳු සිරිපාද | තබුරු |
| | කිවුමෙලෙසිං එ හිමි සඳුගෙ තරාසයේ තිබුනු | අයුරු |

99. විදමන් බැරිකල කමට ගත්තෙ මගෙ දුන්න අතට  එවුරු
මෙලෙසං රජසිංහ නරිඳුං වදහල බස් නොගෙවන  තුරු
අහසිං චිත් සෙනෙහබඩ් මෙන්කර සිටියත් සවන්  බිහිරු
ඉවත සිටතුරෙක වැදුනි සුරිඳු ඇරවූ සරය  සොඳුරු

100. උදක් මෙලෙස තෙද බලපෑ රජසිංහ නිරඳුගෙන්  මහත්
නොයෙක් විලස පුද පඬුරුත් සමඟ රැගෙන රන්  දුන්නත්
එසක් සුරිඳු විලසින් සවුසිරි ශප විදිමින්  එදිමුත්
මෙලක්දිවෙ සවු සත රැක වැජබෙයි එසුරිඳු  සිරිමත්

101. තෙදින් නොයෙක් තුති  රැස්කර
නිතිං එසක් රජ  තොස්කර
ඔවුන් උදක් සිටි  දුඹර
කියමි මදක් වත  විස්තර

102. සපුනා තුරු සුපිපි  මලින්
රැගෙනා එන සුවඳ  මලින්
ගිමනා මද එම  දකලින්
එවනා තුරු කෙලිති  ලොලින්

103. තල් පොල් දෝතුලි  කිතුලී
දෙල් බෙලි කීනද  මිදෙලි
සල්කල් හරමිද  පුපලී
මල් පල්ලෙන් බිම  බැබලී

104. අරළු ද බුළු කටු  කැන්දය
වෙරලු ද පළු බු  කැන්දය
නෙරළු ද කළුවර  කැන්දය
ගිවුළු ද නෙළු උල්  කැන්දය

105. රැස්කර පලරැස  ඇමතැන
තොස්කර සිවුමුව  මැවුවෙන
මස්මොරගස් නිති  පලගෙන
විස්තර කර සැදි  මෙලෙසින

106. කැළුම් යුතුව සුපිපි  මනා
දෙළුම් දොඩං  නාරමිනා
බැළුම් පවනකී සුරෙ  නානා
ඇළුම් කරති එහි  නිතිනා

107. යොදුන් ගනන් දිග  පුළුලැති
නදුං උයන විලස  දිලෙති
පසන් එම වන තුරෙහි  තෙදැති
නිතින් එසුරනිඳු  වැජබෙති

108. සඳුං කපුරු තුරු රසිනා
සඳුන් එවන තුරු නිතිනා
වෙතින් වෙනම ඇති ලෙසිනා
කියත් කෙලෙස එක මුවෙනා

109. සුසැදි පහන් එලි එලියන්
වැලදි නිතින් තුරු හිමියන්
බමර රුවින් කියන ගියන්
අසති තොසින් වන දෙවියන්

110. කමල් උවත් තන තිසරු
එවිල කතුන් තන තිසරු
ලකල් තුරන් තුන රුසිරු
උපුල් නෙතින් බලනයුරු

111. ගත්එල රස එබුදි මිනා
විත්තුර මුදුනත සිටිනා
මත් කොවුලිදු කුල්මතිනා
දෙත් අමයුරු ඍද නොමිනා

112. ගත්මෙන් ඉඳු නිලින් නිලය
පත් විලමෙන් පිලින් පිලය
එත් මොණරුන් පෙලින් පෙලය
දෙත් රඟගිරි කැලින් කැලය

113. බසිමින් තැනට ඇල දොලින
අනිති නොගොස් රුල රලින
ඉසිති පුලිඟු දල දලින
සිටිති ගජන් පොල පොලින

114. දෙණ මෙන් යා කුලින් කුලය
ගසමින් අත් බලින් බලය
අනිමින් පොර පොලිං පොලය
මෙලෙසින් මුව රලිං රලය

115. පැටි පැටවුන් සමගින්නේ
වැටි බිඳ දල යුවලින්නේ
සිටි තුඟ තර ඌරන්නේ
සැටි දුටුවොත් බියවන්නේ

116. කෙසරුන්නෙන් නිසි ලෙස රුදුබල
බුදිමින්නෙක රුදු මුවකැල
දිවියන්නේ සරි දුටුකල
දිවියන්නේ නියමයි බල

117. පොරවාගෙන සුනිල පලස්
ගොරවා උන් නාකි වලස්
ඔරවා කන නොයෙක් තුබස්
ගොරවා බිය කරති වලස්

118. මෙලෙසින් සැදි එවනතුරේ
සමගින් සැදි එපිරිවරේ
කෙලෙමින් සැදි රනිදු එවරේ
සතොසින් වැජඹෙයි නිතො

119. නදුන් උයන ලෙස වනතුරු නිසි ලෙසය
පසන් එසුරනිදු සිරිසර විද තොසය
නිතින් දියකෙලින දුරුකර සර සේය
කියන් මදක් මහවැලි ගඟ සැදි ලෙසය

120. සතර සරණ ලස දෙනුවර සමන්ගිර
සතර වරන් දෙව්වින් සිට දිගු සතර
සතර සුමන මල්දම් පුදකල අයුර
සතර ගඟ මෙලක සුසදුනි මෙලකදර

121. එයින් උතුරා දිග ගිය ගඟ මෙම මහාවැලී
කැළුම් සුනිල් මිනියුරු සපිරුන සිලිලී
නිතින් බිඟු සරණ සුපිපුන කමළුපුලී
ඇළුම්කර යෙදුමු සත සිතට හැමකලී

122. පොලිං පොල සුසැදි තුඟු තුල් ගඟුලැලීය
පිලින්පිල උලැගි තරතර රඟ දිදුලීය
පෙලිං පෙල උනමු වෙත යන මෙන් රැලීය
දොලින් දොල එගඟ වෙත වෑහෙණ සිලිදීය

123. තිවශර එසුන්කල මුනිරජුගෙ පැහැසරෙ
පදස සර ලසුන් දෙවු මව දිසි සමන්ගිරෙ
පුවතර නිතින් මහාවැලි ගඟ එමනහැරෙ
සමඳුර රංදුන් දිගුකල අතෙක සිරිසරෙ

| | | |
|---|---|---|
| 124. | දිණයුත් තඹර පැලස සොම් මන | දුල්ල |
| | සමවත් කුසුම් සාගර සප් සුම් | පුල්ල |
| | තියුලක් සිරස සුලලිත දල | සුම්බුල්ල |
| | සිරිගත් සුරනදි මහවැලි ගඟ | දුල්ල |
| 125. | නිසිනම් කමුළුපුල් නින් ඔරැදි | පැහැසර |
| | සසොවන් තුරඟ සමුදුර දිසි | පෙනයකර |
| | සුපසන් මෙලකඟන කිරුලෙ වූ | සමන්ගිර |
| | තුබසිං නිකුත් දිව නයි මෙනි | මෙගඟවර |
| 126. | තඹුරු මදන බැමලෙල තරඟ | නෙතපුලී |
| | ලපිරු දෙපියයුරු හන්ස නැබ | සලාදුලී |
| | සොඳුරු නිතඹ වැලිතල බිඟුසත් | තෙපුලී |
| | සයුරු රජ බිසොමෙනි මෙගඟ | මහවැලි |
| 127. | දිගුතර දල යුවල වැලිතල | දිස්වීය |
| | දුරුකල සමන්ගිරතුරග | සරනස්වීය |
| | මනහර නිසි මෙම මහවැලි ගඟ | තොස්වීය |
| | සමුදුර විලට දිගුකල සොඩ | ලෙසවීය |
| 128. | සසොබන වණත කමලත නෙතැනිලුපුල් | දිලෙණා |
| | වසමින තනහසුං තුඟුරල සළු | පොටිණා |
| | දුටුතැන සතුන් ලොබ කරවන නිසා | ලෙසිණා |
| | වෙසඟන සිරි සැපයි මහවැලි ගඟ | නිතිණා |
| 129. | බැතියෙන් උත්තම හිමිවෙතට | සමුදුරෙ |
| | ගියතැන් පටන් වෙන් නොව වසන | නරතුරෙ |
| | වෙනතැන්වල ඇළුම්කර වසන | යනකරෙ |
| | පතිදැන් රැකි ලියක් මෙනි මෙගඟ | මනහැරෙ |
| 130. | පෙරකල් ඔබ මවනකල නෙක | මුළුනෙදිය |
| | දැකඳුල් තැනින් මෙසුරිඳු එන බව | මෙදිය |
| | හැමකල් නිසිලෙස දියකෙලිනට | ලදිය |
| | සුනිමල් මෙගඟ කල මෙනි ලෙස | සුරතිය |
| 131. | මුතුපට වගෙන දෙගොඩින් සැදි | සුදුවැල්ලේ |
| | ගිරිතුර රගෙ සිට විඳ මද | පවනැල්ලේ |
| | මහවැලි ගඟෙහි විසිතුරු සුවි | පුල්ලේ |
| | කෙලෙයි තුරගෙ වැජඹෙයි එසිරිදු | දුල්ලේ |

| | | |
|---|---|---|
| 132. | බාර මෙසිරිලක රවිඳුන් උරබිතු සළු | ලෙදෙ |
| | නැර සිසිල් පිරිමහවැලි ගඟ අසමන | නදෙ |
| | සර ඉසුරු සැදි කුණ්ඩසාල නම් පුර | සෙදෙ |
| | වීර පරාක්‍රම නරේන්ද්‍ර හිමි වැජබෙන | සඳේ |
| 133. | ගල්ලවමින් දිඟුතුන් තුඩ තුතිය | එසඳුන් |
| | ලොල්ල කතුන් කරවණ තුනුරුසිරෙන් මද | දරඳුන් |
| | දුල්ල තෙදින් දිසි නරේන්ද්‍ර සිංහ ණම් හිමි | සඳුන් |
| | සෙල්ලමකින් දිනයක වැඩසිටි ලෙස සුර | නිඳුන් |
| 134. | නුබතල යන මානෙක් දැක හැර | රාජාලියෙක් |
| | නොපැකිල ගොස් ඔහු හැර අහසට නැගෙමින් | උදක් |
| | එමකල විදුකිදු විලසින් වට්ටන්ලා | නොයෙක් |
| | මඩකලපුව දෙස බලමින් ගියනොව | දුටුතෙණෙක් |
| 135. | තුෂරකර සෙයස බැතිවර නරේන්ද්‍ර | හිමිතුමා |
| | එවරයන්ට වදහල සඳ සෙණගට | නොවපමා |
| | නොහැර ගොසින් විමසා රට ගම්වල | තුරුඋමා |
| | පවර සමිඳු දැක කිවු බැරිවුන රඟ | බියවමා |
| 136. | සසොබන සිරිවර නරේන්ද්‍ර සිංහ නම් | හිමිසඳේ |
| | අයදින ලෙස පිටියේ සුරිඳුට වදහල | සඳේ |
| | අපමණ විකුමෙන් ගෙන්වා විගසම මන | නදේ |
| | පසුදින රජවිමනත වෙත විත් සිටියේ | උදේ |
| 137. | දකිමින් එවිකුම් නරේන්ද්‍ර සිහනම් | හිමිලකල් |
| | සමගින් කුඩ කොඩි පසතුරු ගොස කරවමි | විපුල් |
| | නොමදින් පටපඩුරුත් දෙවු එසුරිඳු හට | උදුල් |
| | එමදින් අපමන තුති ලදි කිවිඳුන් ගෙන | නිමල් |
| 138. | සසොබන පිටියේ සුරිඳු | පසන්නේ |
| | අපමන තද තෙද බල | පාමින්නේ |
| | ලැඹගෙන නෙක පුද | සතොසින්නේ |
| | මෙලෙසින් සවුසිරි විඳ | වැජබෙන්නේ |
| 139. | සුපසත් එසුරිඳු මෙලකට | සතොසේ |
| | වැඩිතැන් සිට එම පිරිවර | පිනිසේ |
| | සෙබළුම් යක්කරගත් නම් | වෙසෙසේ |
| | පවසත් සවුසතහට සෙත් | පිනිසේ |

140. එදා තද තෙද පෑ සුද්දේ
තොමදා සිරිලක කෙලි පුද ලද්දේ
දෙව්දා විසිතුරු පල්ලේ බැද්දේ
හැමදා සවුසත රකිමින් සෙත්දේ

141. අම්තුරු පියුසම් මන් බිඳ දස්සේ
තිසයුරු මෙන් යස දස ඉන්සේ
පිවිතුරු බණ්ඩාර ද වෙල්ලස්සේ
තිරතුරු සතරස රකදෙන් නොවලස්සේ

142. ලීල නොකර තද තෙද ලෙස් කරමිංදෑ
ආලවඩන සොඳ කෙලිපුද ගංදෑ
පැල විකුම් තෙද බලකරවන්දෑ
රාල හාරගම සෙත්සිරි දෙන්දෑ

143. කසවු බබලණ තුනුරුපත්
හසුම් දෙතන පිරි සඳවෙනි පැහැපත්
පසම් ගිරාගම එතනාසාමිත්
නිතින් මෙසවු සත රකපන් දී සෙත්

144. සිටුවන්නට බැරි තෙද පාමින්නේ
දුටුවත් ලෙඩකරන කෙලි පුදගන්නේ
කටුගම්පල රාලත් සුපසන්නේ
තුටුවෙන් සවුසත රක සෙත් දෙන්නේ

145. නුවෙන් ඔහු සරි පුයසුන් බලවත්
පාමින් අපමන තදතෙද විකුමුත්
පායිං ගොමුවේ නිසි බන්ඩාරදෙත්
බොහෝපෙන් කරවන සවුසිරි සලසාදෙත්

146. තද තෙද විකුමන් පලකර වන්නේ
නොවරද කෙලි පුද පඩුරු ලබන්නේ
මණණ ද උඩුවෙල රාල පසන්නේ
හැම සඳ සවු සත රක සෙත් දෙන්නේ

147. රුදුරු තෙදැති දැඩි අප්පු ද සිරිත්
සොඳුරු රුවැති කළු අප්පු ද සිරිත්
සපිරි රෝග නෙක උවදුරු අයටත්
අදුරු දුරලරිවි මෙන් ලෙඩ දුරලත්

148. වීර විකුම් ඇති කළු ණෛදේයා
සාර රුවන් කම්තිල ණෛදේයා
දීර පඟර ගහම්මන ණෛදේයා
නෑර සතුන් රක සෙත්සිරදේයා

149. සුවිපුල් තෙද ඇති කුමාරසාමිත්
මනකල් දිසුරු සිරුති මුතුසාමිත්
පිලිමල් දපහල බිලිඳු එසාමිත්
සැමකල් සත රකු පුලියා සාමිත්

150. යකුන් සමඟ පිටියේ දෙවියන්නේ
නිතින් රැගෙන කෙලි පුද වැජඹෙන්නේ
පසන් මෙලෙසි සද්දේ තස තොසින්නේ
සතුන් රෝග බියදුරු රකින්නේ

151. මෙලෙසින් යක්සෙන් පිරිවර රැගෙනා
සුපසන් පිටියේ සුරනිඳු නිතිනා
රකිමින් සවුසත වෙත කර කරුනා
මෙලෙසිං වැජඹෙයි කෙලි පුද රැගෙනා

152. දක්ෂ විරාජිත කත්තන සේන්ද්‍රම්
ඉක්ෂු ධනුර්ධර රූප රතීන්ද්‍රම්
ලක්ෂු විවාශති වික්‍රම තන්ද්‍රම්
රක්ෂතු ශ්‍රී වර රාජ නරේන්ද්‍රම්

153. ...ල දයාකර නාඟ ෂූ මේන්ද්‍රම්
කීර සුසාඟර නාඟ සුරේන්ද්‍රම්
ජෝති නිසාකර කීර්ති විජේන්ද්‍රම්
පාතුදිවාකර වශ නරේන්ද්‍රම්

154. ධීර සාවික්‍රම සේම උපේන්ද්‍රම්
පැර අතික්‍රම ශස්තු විජේන්ද්‍රම්
වීර පරාක්‍රම සිංහ නරේන්ද්‍රම්
නෑර සුරක්ෂතු පිටියේ සුරේන්ද්‍රම්

155. ඉස්වා යසරුස් දස දෙස නු ශදු
වස්වා සෙත්සිරි සතහට පසිදු
තොස්වා නිරතුරු පිටියේ සුරිදු
පස්වා දහසක් කල් රකු සමිදු

156. එසුරිඳු තෙද පබද
කිවිසර බසින් මනනද
තුතිකර කියන ලෙද
වදහලෙන්වර නරේන්ද්‍ර හිමිසඳ

[illegible]

157. පියසෙකී — දොඩන්වල
සිව්යර මිනිස් — මතනද
සුසිකර සිහස — ලෙද
වදනලෙක්වර නරේන්ද්‍ර — හිමිසද

158. එතුරිදුනේ — සසොබසය
යසතෙද විකුම් — පමනය
කල මෙකවී — එදැනමය
එසිය නවපනසකි — සදනුය

159. සක වසිතෙක් — දහස
සසිය සතලිස් — නවාමස
ගුරුදින — තිකිණිමස
මෙකවි පොත — නිමිවස


වයි.කේ.තිස්ස බණ්ඩාර,
**BA(Hon's)MSSc,**
පුස්තකාලයාධිකාරි (වැ.බ),
ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය,
අනුරාධපුරය.